ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 10 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ඩෙල්ෆ්ට් ප්‍රදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 2,880 | - | - |
| අත්හැරීම් | - | - | 01 | 691,225 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,243,928 ක් වූ ගනුදෙනු 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.1,324,059 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.4,739,057 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ලේඛනයේ නිසි පරිදි පිළියෙල කර නොතිබූ අතර එබැවින් තථ්‍ය ආදායම් සහ ඇස්තමේන්තුගත ආදායම අතර රු.2,951,741 වෙනසක් සහ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.3,556,685 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

-------------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| ---------------- | ----------------- | --------- | --------------------- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 230 | 143 | 22 |
| බදුකුලී | 208 | 284 | 139 |
| බලපත්‍ර ගාස්තු | 10 | 34 | - |
| වෙනත් ආදායම් | 2,846 | 5,784 | 253 |

2.3.2 ආදායම් කළමනාකරණය

----------------------------------

බදු, කුලී, වෙළඳ බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් රු.414,308 ක් අයකර ගැනිම සඳහා අර්ථවත් ලෙස කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ

--------------

ගිණුම් වල ඇතුලත් කිරිමට හැකිවන අයුරින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ පිළිබඳ ලැයිස්තුවක් කැඳවා නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

------------------

ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්වල ඇතුලත් කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

------------------------------------

2.4.1 වාර්ෂික සමික්ෂණ මණ්ඩල

-----------------------------------

ස්ථාවර වත්කම් සහ ගබඩා විෂයයන් සමික්ෂණ මණ්ඩලයක් විසින් හරිවැරදි බලා නොතිබුණු අතර පොත් අගය මත රු.16,140,600 ක් ලෙස දක්වා තිබුණි.

විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුදල |
| --- | --- |
| | රු. |
| ස්ථාවර වත්කම් | 13,211,265 |
| ගබඩා විෂයයන් | 2,929,335 |
| | ----------------- |
| | 16,140,600 |
| | =========== |

2.4.2 අත්තිකාරම් ගිණුම්

--------------------------

(අ) අත්තිකාරම් එය ලබාදුන් කාර්යය සම්පූර්ණ කර අවසාන වූ වහාම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල දෙන ලද රු.310,819 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි.

(ආ) රු.156,715 ක් වූ අත්තිකාරම් වර්ෂ 10 කට අධික කාලයක් පියවා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | කාර්යය | මුදල |
| --- | --- | --- |
| | | රු. |
| 1999 | ජල සම්පාදනය ව්‍යාප්ත කිරිම | 100,000 |
| 2000 | භාණ්ඩ මිළදි ගැනීම | 56,215 |
| 2004 | සාමාජිකත්වය සඳහා අත්තිකාරම් | 500 |
| | | ---------------- |
| | | 156,715 |
| | | ========== |

2.5 අනුකූල නොවීම්

-----------------------

පහත සහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදායට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශිය සභා ( මුල්‍යා සහ පරිපාලන) රීති - 1988 | | |
| | (i) II පරිච්ඡේදයේ 5(xii) වගන්තිය | - | මුදල් සහ ගබඩා සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින් ගෙන් ආරක්ෂක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| | (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | මුද්දර ගාස්තු සහ දඩ සම්බන්ධයෙන් සභාව ත්‍රෛමාසිකව කටයුතු කර නොතිබුණි. |
| | (iii) V පරිදච්ඡේදයේ 140 වගන්තිය | - | රු.310,819 ක් වු නොපියවු අත්තිකාරම් අයකර ගැනිමට සභාවේ ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | - | වර්ෂ 2 කට වඩා පැරණි රු.42,396 ක් වු විවිධ තැන්පතු ආදායමට මාරුකර නොතිබුණි. |
| (ඇ) | උතුරු පළාත් සභා රීති අංක 101 සහ 102 | - | සභාව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ත්‍රෛමාසික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු | - | එකතු කරන ලද රු.125,006 ක් වු එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.6 ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

-----------------------------------

(අ) 2010 සහ 2011 වර්ෂයන් තුල සිවිල් වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ණයහිමියන් ලෙස රු.21,260,557 ක ප්‍රතිපාදනයක් සලසා තිබූ අතර ඉන් සිවිල් වැඩ 10 ක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් දක්නට ලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘති 06 ක රු.86,150,000 ක් වටිනා පුනරුත්ථාපන වැඩ ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදි කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගත් රු.40,896 ක් වූ රැඳවුම් බදු ඔවුනට ගෙවා නොතිබුණු අතර එය තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

(ආ) සේවකයන්ගෙන් අයකරගත් රු.3,150 ක් විවිධ තැන්පතු ගිණුමෙහි ගබා තිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

----------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරීම

(ii.) ස්ථාවර වත්කම්

(iii.) ගිණුම්කරණය

(iv.) විවිධ තැන්පතු